# ලංසු සඳහා ආරාධනයයි (IFB)

## මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය

## පරිසර පද්ධති සංරක්ෂණය හා කළමනාකරණ ව්‍යාපෘතිය (ESCAMP)

## ශ්‍රී ලංකාව, ඉනාමලුවේ ශ්‍රී ලංකා වන සංරක්ෂණ ආයතනයේ ක්ෂේත්‍ර පුහුණු මධ්‍යස්ථානයේ යෝජිත සංවර්ධනය සඳහා ගොඩනැගිලි සහ යටිතල පහසුකම් සංවර්ධනය

**IFB අංකය : LK-ESCAMP-PMU-97198-CW-RFB**

01. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය වෙත ලෝක බැංකුව වෙතින් පරිසර පද්ධති සංරක්ෂණය හා කළමනාකරණ ව්‍යාපෘතියේ පිරිවැය අරභයා ණය මුදලක් ලැබී ඇති අතර, ඉන් කොටසක් ශ්‍රී ලංකාවේ ඉනාමලුවේ ශ්‍රී ලංකා වන සංරක්ෂණ ආයතනයේ ක්ෂේත්‍ර පුහුණු මධ්‍යස්ථානයේ යෝජිත ගොඩනැගිලි සහ යටිතල පහසුකම් සංවර්ධන ඉදිකිරීම සඳහා වන කොන්ත්‍රාත්තුව යටතේ ගෙවීම් සිදු කිරීම සඳහා යොදා ගැනීමට අපේක්ෂා කෙරේ.

02. මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශයේ පරිසර පද්ධති සංරක්ෂණය හා කළමනාකරණ ව්‍යාපෘතිය වෙනුවෙන් ව්‍යාපෘති ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ ඉනාමලුව ශ්‍රී ලංකා වන සංරක්ෂණ ආයතනයේ ක්ෂේත්‍ර පුහුණු මධ්‍යස්ථානයේ යෝජිත ගොඩනැගිලි සහ යටිතල පහසුකම් සංවර්ධන ඉදිකිරීම් සඳහා යෝග්‍යතාපූර්ණ සහ සුදුසුකම්ලත් ලංසුකරුවන් වෙතින් මුද්‍රා තබන ලද ලංසු දැන් කැඳවනු ලැබේ. වැට් බදු හැර ඇස්තමේන්තු කළ පිරිවැය රු. මිලියන 200 කි.

ගොඩනැගිලි සැලසුම්, පිරිවිතරවල, පරිසර කළමනාකරණ සැලසුම් සහ ප්‍රමාණ පත්‍රවල විස්තර කොට ඇති පරිදි යාන්ත්‍රික සහ විදුලි කර්මාන්ත ඇතුළුව ඉනාමලුව ක්ෂේත්‍ර පුහුණු මධ්‍යස්ථානයේ ගොඩනැගිලි 25 ක සිවිල් කර්මාන්ත විෂය පථයට අඩංගු වේ.

**ඉදිකිරීම් කාලය දළ වශයෙන් දින 365 කි.**

03. ජාතික තරඟකාරී ලංසුකරණ පරිපාටිය යටතේ ලංසු කැඳවනු ලැබේ.

- කොන්ත්‍රාත් ප්‍රදානය සඳහා සුදුසුකම් ලැබීමට සාර්ථක ලංසුකරු අසාධු ගත නොවී සිටිය යුතු අතර, පහත සඳහන් සුදුසුකම් සහ නිර්ණායකයන් සපුරා තිබිය යුතුය.
- ලංසුකරු ගොඩනැගිලි ඉදිකිරීම් විශේෂතාවය සඳහා සී3 (C3) හෝ ඉහළ ශ්‍රේණියක CIDA (පෙර ICTAD) ආයතනයේ ලියාපදිංචිය ලබා තිබිය යුතුය.
- පසුගිය වසර පහ ඇතුළත ඉටුකළ ඉදිකිරීම් කර්මාන්තවල වාර්ෂික ධාරිතාවේ සාමාන්‍යය අවම වශයෙන් රු. මිලියන 300 ක් විය යුතුය.
- මෙම කොන්ත්‍රාත්තුව යටතේ සිදුකළ යම් අත්තිකාරම් ගෙවීමක් හැර තිබිය යුතු අවම ද්‍රවශීල වත්කම් සහ / හෝ ව්‍යාපෘතියට නිශ්චිත ණය පහසුකම් රු. මිලියන 50 ට අඩු නොවිය යුතුය.

04. මේ සඳහා උනන්දුවක් දක්වන ලංසුකරුවන් වැඩිදුර තොරතුරු 2019.05.02 වෙනි දින දක්වා පෙ.ව. 9.00 සහ ප.ව. 3.00 අතර කාර්යාල වේලාව තුළදී බත්තරමුල්ල, රජමල්වත්ත පාර, අංක 82, "සම්පත්පාය" පරිසර පද්ධති සංරක්ෂණ හා කළමනාකරණ ව්‍යාපෘතියේ ප්‍රසම්පාදන අංශය වෙතින් ලබාගත හැකිය. සාමාන්‍ය රාජකාරි වේලාව තුළදී ඉහත සඳහන් ලිපිනයේදී ලංසු ලිපිලේඛන නොමිලේ පරීක්ෂා කර බැලිය හැකිය. (**දුරකථන අංක : 0112888426 / 0112888427**)

05. ආපසු ගෙවනු නොලබන රු. 50,000.00 ක ගාස්තුවක් ගෙවීමෙන් අනතුරුව 2019.03.25 වෙනි දින සිට 2019.04.26 වෙනි දින දක්වා බත්තරමුල්ල, රජමල්වත්ත පාරේ අංක 82 හි "සම්පත්පාය", පරිසර පද්ධති සංරක්ෂණ හා කළමනාකරණ ව්‍යාපෘතියේ ව්‍යාපෘති අධ්‍යක්ෂ වෙත CIDA ලියාපදිංචි සහතිකයේ පිටපතක් සමග ලිඛිත අයදුම්පතක් ඉදිරිපත් කිරීමෙන් මේ සඳහා උනන්දුවක් දක්වන ලංසුකරුවන්ට ඉංග්‍රීසි බසින් සකස් කරන ලද ලංසු ලිපිලේඛන සම්පූර්ණ කට්ටලයක් මිලදී ගත හැකිය. ගෙවීම් මුදලින් පරිසර පද්ධති සංරක්ෂණ හා කළමනාකරණ ව්‍යාපෘතියේ ව්‍යාපෘති ගණකාධිකාරී වෙත සිදු කළ යුතුය.

06. පිටපත් දෙකකින් යුත් සම්පූර්ණ කරනලද "මුල් පිටපත", සහ "අනු පිටපත" ලෙස සඳහන් කළ කවර දෙකක බහා මුද්‍රා තබා, නැවත එම කවර දෙක තනි කවරයක බහා එහි වම්පස ඉහළ කෙළවරේ "**කොන්ත්‍රාත් අංකය සහ ඉදිකිරීම් ශීර්ෂය**" සඳහන් කර, **2019.05.02 වෙනි දින පෙ.ව. 11.00 ට හෝ ඊට පෙර** ලැබෙන පරිදි පහත සඳහන් ලිපිනය වෙත ලියාපදිංචි තැපැල් මගින් එවීමට හෝ බත්තරමුල්ල, රජමල්වත්ත පාරේ අංක 82 හි "සම්පත්පාය" පරිසර පද්ධති සංරක්ෂණ හා කළමනාකරණ ව්‍යාපෘතියේ ව්‍යාපෘති කළමනාකරණ ඒකකයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ බහාලීමට හැකිය. ප්‍රමාද වී ලැබෙන ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ. ලංසු භාරගැනීම අවසන් වූ වහාම එම අවස්ථාවට පැමිණ සිටීමට කැමැත්තක් දක්වන ලංසුකරුවන්ගේ නියෝජිතයන් ඉදිරියේ ලංසු විවෘත කරනු ලැබේ.

07. වැඩ බිම් සංචාරය සහ පරීක්ෂා කර බැලීම 2019.04.09 වෙනි දින 10.00 ට පැවැත්වේ. පූර්ව ලංසු රැස්වීම එදිනම (2019.04.09) ප.ව. 2.00 ට ඉනාමලුව ක්ෂේත්‍ර පුහුණු මධ්‍යස්ථාන පරිශ්‍රයේ පැවැත්වේ.

08. ලංසු, 2019.10.04 වෙනි දින දක්වා වලංගු විය යුතුය.

09. සියලුම ලංසු සමග මහ බැංකුව විසින් අනුමත කරන ලද වාණිජ බැංකුවක් විසින් නිකුත් කරන ලද ලංසු ඇපකරයක් අමුණා එවිය යුතුය. ලංසු ඇපකරයේ වටිනාකම රුපියල් මිලියන දෙකක් (රු. 2,000,000.00) විය යුතු අතර, ලංසු ලිපිලේඛන සමග අමුණා ඇති ආකෘතිය ප්‍රකාරව විය යුතුය. ලංසු ඇපකරය 2019.10.31 වෙනි දින දක්වා වලංගු විය යුතුය. වලංගු ලංසු ඇපකරයක් අමුණා නොමැති ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ.

10. ලංසුකරුවන්, ලංසු සමග පොදු කොන්ත්‍රාත් පනතේ PCA3 ආකෘතිය (1987 පොදු කොන්ත්‍රාත් පනත) ඉදිරිපත් කළ යුතුය.

11. වැඩබිම් සංචාර සම්බන්ධ පිරිවැය හා වියදම් ඇතුළුව ලංසු පිළියෙල කිරීම සහ ගෙනැවිත් භාරදීම සම්බන්ධයෙන් ලංසුකරුවන්ට